27 04 2025

හිතවත් සාලිය

අප වෙත ලබා දී ඇති මාතෘකාව

**“උපතින් බෞද්ධයන් ප්‍රඥාවෙන් සන්නද්ධ නොකිරීමේ නස්පත්තිය (Destruction) Vs මහා නායක හිමිවරුන්ගේ ශාසනික වගකීම”**

**“වාර්තාව අවසානයේ ඇති පසුවදන කියවත්වා ! ”**

හිතවත් සාලිය

ඉහත මාතෘකාව ආශ්‍රිතව බහුතරයකට තේරෙන භාෂාවෙන් සරල සිංහලෙන් කරුණු පහදා දීම සඳහා මෙම වාර්තාව වඩාත් ශාස්ත්‍රීය (නොවන) ආකාරයට පිළියෙල කොට ඇත.

“එහිදී වර්තමානයේ සන්නිවේදනය සඳහා භාවිතා නොකරන (පාලි) භාෂාවෙන් කරුණු පැහැදිලි කිරීමක් හෝ, සංකීර්ණ ව්‍යාකරණ යෙදුම් සහිත සාහිත්‍යමය හරබර වචන කිසිවක් භාවිතා නොකෙරේ. මුඛ්‍ය පරමාර්ථය වන්නේ විද්වත් මණ්ඩලයේ මෙන්ම වාර්තාව පරිශීලනය කරන සර්ව ආගමික සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත සහෝදරත්වයෙන් තාර්කිකව කරුණු කාරණා පහදා දීමයි. එමගින් ආගමික සංහිඳියාව ඇති කිරීමයි. බුද්ධ වචනය නිර්මලව පැහැදිලි කිරීමයි.

“දළදා ප්‍රදර්ශනය” සහ “දළදා වන්දනාව” යන සංසිද්ධීන් පුළුල් ආධ්‍යාත්මික පසුබිමකින් සමාජගත කිරීමයි.

ප්‍රශස්ත මට්ටමේ ක්‍රියාවන් වන දන්සැල් පැවැත්වීමෙන්, ගිලනුන්ට උපස්ථාන කිරීමෙන් හෝ පෞද්ගලික න්‍යායපත්‍රයන් සමග අවිද්‍යාව ඉස්මතු කිරීමෙන්, මං පොර මානසිකත්වයෙන් හුදෙක් සෘණාත්මක අධ්‍යාත්මික ඉලක්කවලට පරිබාහිරෙන් පිහිටා ඇති

“මහා නායක හිමිවරුන්ගේ ශාසනික වගකීම”

කුමක්දැයි බෞද්ධ ගිහියන් විසින් සමාජයට පහදා දීමයි.

ධනාත්මකව ගනිත්වා !

1) මාතෘකාවේ වපසරිය

**1.1** උපතින් බෞද්ධයන්

**1.2** ප්‍රඥාව

**1.3** සන්නද්ධ නොකිරීම

**1.4** නස්පත්තිය **(Destruction)**

**1.5** මහා නායක හිමිවරුන්

**1.6** ශාසනික වගකීම

**1.7** මූලාශ්‍ර

**1.8** නිරීක්ෂණය

**1.9** පසුවදන

2) වාර්තාවේ වපසරිය තවදුරටත් ප්‍රසාරණය

**2.1** ඉපදෙන්නේ නම් නැවත ඉපදීම

**2.2** දැනීම / ඥාණය / ප්‍රඥාව

**2.3** දැනුමේ ඌණතාවය

**2.4** සමාජ ව්‍යසනය

**2.5** ථේරවාදී භික්ෂූන්ගේ අධීක්ෂණය හා නියාමනය

**2.6** ගිහි පැවිදි දෙපාර්ශ්වයේම අභිවෘද්ධිය හා චිරස්ථිතිය

**2.7** මූලාශ්‍ර : මහා නිධාන සූත්‍රය / මහා පදාන සූත්‍රය / සබ්බාසව සූත්‍රය / මනසිකාර සූත්‍රය / මහාපරිබ්බාන සූත්‍රය

**2.8** නිගමනය

**2.9** පසුවදන

3) ශ්‍රී ලාංකික සමස්ත සමාජයම ආර්ථික, පාරිසරික සහ සමාජයීය වශයෙන් මුළුමනින්ම උඩුකුරු යටිකුරු විය යුතු කාල පරිච්ඡේදයක සර්ව ආගමික පරිසරයක් තුළ සාධනීය වෙනසක් අපේක්ෂා කරන අවධියක ආගමික නායකයන් අතරින් බෞද්ධ නායකයන්ගේ වගකීම පිළිබඳව පමණක් අදාළ වපසරිය තුළ මෙම වාර්තාවේ විෂය පථය සීමා කොට ඇත.

එහිදී බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් වල මූලාශ්‍ර පමණක් යම් ප්‍රමාණයකට සාකච්ඡා කෙරෙන අතර දේශපාලන ගැතිභාවයකින් තොරව ජන සමාජය තුළ "ප්‍රඥා සහගත බව" ඉස්මතු කර ගැනීම සඳහා ප්‍රයත්නයක් දරුණු ලැබේ. එසේ හෙයින් කිසිදු ගිහි හෝ පැවිදි හෝ චරිතයකට දෝෂාරෝපණයක් හෝ මඩ ගැසීමක් හෝ විවේචනය කිරීමක් හෝ එවැනි පරමාර්ථයක් අදහස් නොකෙරේ.

ලිපියේ ව්‍යාකරණ, ශෛලිය, ඉදිරිපත් කිරීම වැනි කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු නොකොට ප්‍රකාශිත අන්තර්ගතය තුළින් ගම්‍ය වන කරුණු පමණක් අවධානයට ගෙන සර්ව ආගමික පරිසරවල සියලු ජන සමාජවල එකිනෙකා අතර ප්‍රශස්ත මට්ටමේ චිර ජීවනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ පාර්ශ්ව වල බුද්ධි වර්ධනය පිණිස උපයෝගී කර ගනිත්වා !

4)

## 4.1 ඉපදෙන්නේ නම් නැවත ඉපදීම

බෞද්ධ පවුලක ඉපදුනත් බෞද්ධයෙකු ලෙස තම ජීවිතය සකස් කර ගැනීමේදී (මූලික) වශයෙන් ප්‍රධාන ගුණාංග දහයක් නිරීක්ෂණය කළ හැක.

"නමුත් මෙම කරුණු දහයෙන් ඔබ්බට ගිය මනසක් සංවර්ධනය කරගත යුතු කරුණු කාරණා වෙන් වෙන්ව පැහැදිලිව බෞද්ධ දර්ශනයේ සඳහන් වේ."

01. උපාසකො සංඝෙන සමානසුඛදුක්ඛො හොති : ආගමික නායකයන්ගේ විධිමත් උපදෙස් මත තම තමන්ගේ සම්මුති ලෝකයේ ජීවිතය යහපත් කර ගැනීම.

02. ධම්මාධිපතෙය්‍යො හොති : ධර්ම කරුණු පරිශීලනය කරන්නටත් ඒ අනුව තම ජීවිතයේදී එකී කරුණු පිළිපදින්නටත් අධිෂ්ඨාන කර ගැනීම.

03. යථා බලං සංවිභාගරතො හොති : තමාගේ ආදායමට සහ වත්කමට සමානුපාතිකව දානමය පුණ්‍ය කර්මයන් කරමින් යහපත් අන්දමින් ජීවත්වීම.

04. ජින සාසන පරිහානිං දිස්වා අභිවුද්ධියා වායමති : **තමන්ට උපතින් උරුම ආගමික ඉගැන්වීම් ප්‍රගුණ කරමින් සර්ව ආගමික පරිසරවල මනා සංහිඳියාවක් පවත්වාගෙන යමින් තම තමන්ගේ ශාසනයේ දියුණුව සඳහා ක්‍රියා කිරීම.**

05. සම්මාදිට්ඨිකො හොති අපගතකොතුහල මංගලිකො : **නිවැරදි චින්තනය සඳහා මනස සකස් කරගනිමින් කර්මය හා කර්මඵලය පිළිබඳව විමසිලිමත්ව ජීවිතය ගත කිරීම.**

06. ජීවිතහෙතුපි න අඤ්ඤං සත්ථාරං උද්දිසති : **වර්තමාන ජීවිතයේ තමාට ලැබෙන හෝ ලැබෙන්නට නියමිත වරදාන හෝ වරප්‍රසාද හේතුවෙන් තමන් අනුගමනය කරන ධර්මතාවයන් කිසිසේත්ම අත් නොහැරීම හෝ කඩ නොකිරීමේ වගකීම.**

07. කායිකං වාචසිකං චස්ස රක්ඛිතං හොති : **කය සහ වචනය සංවර කරගැනීම**

08. සමග්ගාරාමො හොති සමග්ගරතො : **සමගියට කැමති බව සහ ඒ සඳහා ක්‍රියා කිරීම.**

09. අනුසූයතො හොති න ච කුහනවසෙන සාසනෙ චරති : **සෑම කල්හිම අවංක ප්‍රතිපත්තියත් අනුගමනය කිරීමට පෙළැඹීම.**

10. බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සංඝං සරණං ගතො හොති : **"යමෙක් බුදුන් සරණ ගියේ ද, දහම් සරණ ගියේ ද, සඟුන් සරණ ගියේ ද ඒ අනුවම එකී පුරවැසියා "උපාසක" යන නාමයට උරුමකම් කියයි.**

## 4.2 දැනීම / ඥාණය / ප්‍රඥාව

සෑම විටම ප්‍රඥාව වර්ධනය කර ගැනීමට බලපාන හේතු පිළිබඳව දැන ගත යුතුය. ගැඹුරු ධර්මය පිළිබඳව කල්පනා කිරීම වැදගත්ය. තමන්ට වඩා ඉහළ මානසිකත්වයෙන් කල්පනා කරන අය ඇසුරු කළ යුතුය. මෝඩයන් ගෙන් වෙන්ව ජීවත්වීමට වගබලා ගත යුතුය. නීවරණ ලෙස හඳුන්වන ධර්මතාවයන් පහකි. එමගින් ප්‍රති පෙරළා ඇති වන්නේ ප්‍රඥාව පහළ වීමට හැමවිටම බාධා සිදුවීමය.

උපුටා ගැනීම

====

4.2.1 මහණෙනි, කාමච්ඡන්දය සිත වසන්නා වූ කුශලය වසන්නා වූ සිත තවන්නා වූ ප්‍රඥාව දුබල කරන්නා වූ ධර්මයෙක,

4.2.2 මහණෙනි, ව්‍යාපාදය සිත වසන්නා වූ කුශලය වසන්නා වූ සිත තවන්නා වූ ප්‍රඥාව දුබල කරන්නා වූ ධර්මයෙක,

4.2.3 මහණෙනි, ථීනමිද්ධය සිත වසන්නා වූ කුශලය වසන්නා වූ සිත තවන්නා වූ ප්‍රඥාව දුබල කරන්නා වූ ධර්මයෙක,

4.2.4 මහණෙනි, උද්ධච්ච කුක්කුච්චය සිත වසන්නා වූ කුශලය වසන්නා වූ සිත තවන්නා වූ ප්‍රඥාව දුබල කරන්නා වූ ධර්මයෙක.

4.2.5 මහණෙනි, විචිකිච්ඡාව සිත වසන්නා වූ කුශලය ආවරණය කරන්නා වූ සිත තවන්නා වූ ප්‍රඥාව දුබල කරන්නා වූ ධර්මයෙක.

මහණෙනි, මේ ධර්මයෝ පස් දෙනාම සිත තුළ ප්‍රඥාව ඉස්මතු වන්නට නොදී දුබල කරන්නා වූ ධර්මයෝ ය.

=====

උපුටා ගැනීම අවසන්

## 4.3 දැනුමේ ඌණතාවය

දැනුමෙන් සහ ආකල්පවලින් සන්නද්ධ නොවන ජාතියක කුසලතාවයන්ගෙ න් පෝෂිත පරපුරක් අපේක්ෂා කළ නොහැකිය.

## 4.4 සමාජ ව්‍යසනය

අප ජීවත් වන ජන සමාජය සෑදී ඇත්තේ පුද්ග ල එකතුවකි. අන්‍යෝන්‍ය සම්බන්ධතාවන් නිසි පරිදි කළමනාකරණය කිරීම හෝ නියාමනය රජයක වගකීම මෙන්ම ආගමික නායකයන්ගේ පරම යුතුකම වන්නේය. එවැනි ක්‍රියාවලියක් නිසි ලෙස සිදු නොවේ නම් සමාජයේ කඩාවැටීම අනිවාර්යයෙන්ම සිදුවේ.

## 4.5 ථේරවාදී භික්‍ෂූන්ගේ අධීක්ෂණය හා නියාමනය

ථේරවාදී බෞද්ධ රටවල්වල බෞද්ධ පැවිද්දන් නිසි ලෙස අධීක්ෂණය මෙන්ම නියාමනය සිදු නොකළහොත් බෞද්ධ දර්ශනයේ සංකල්ප සමාජයට නිසි ලෙස සම්ප්‍රේෂණය නොවේ. බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතරින් ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලාට පැවරෙන මෙම කාර්යය නිසි ලෙස ඉටු නොවන අවස්ථාවන්හිදී මූලිකව සෙසු කණිෂ්ඨ බෞද්ධ පැවිද්දන් ධර්මයෙහි හැසිරීමක් බලාපොරො ත්තු විය නොහැ ක. ඔවුන් වටා ශක්තිමත්ව ගොඩනැගී ඇති සමාජ හර පද්ධතීන් මුළුමනින්ම විනාශ මුඛයට පත්වේ.

මෙකී ශාසනික තනතුරු ශ්‍රී ලංකාව තුළ විවිධ නිකායවලට බෙදී වෙන් වී සම්මා සම්බුදුවරයකුන් ලොවට හඳුන්වා දුන් පොදු විශ්ව ධර්මතාවය තම තමන්ගේ අවිද්‍යා සහගත හිතළු සහ උපකල්පන ආශ්‍රිතව පවත්වාගෙන යාමෙන් ජන

සමාජයේ ද භේද බින්න වී සංස්කෘතික හා ආගමික විරසකයන් නිර්මාණය වී ඇත.

1753 සිට ක්‍රියාත්මක වන සියම් නිකායේත්, 1803 සිට ක්‍රියාත්මක වන රාමඤ්ඤ නිකායේත්, 1864 සිට ක්‍රියාත්මක වන අමරපුර නිකායේත් මහානායක පදවි දරන ලද ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට ඇති ආකාරය මෙන්ම දැනට එකී තනතුරු වලට නායකත්වය ලබාදෙන ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා තම ශාසනික වගකීම කොතෙක් දුරට ඉටුකරන්නේ ද? යන වග ඉතාමත් මැදහත් සිතින් පෘථග්ජනයන් වුවත් තරමක හෝ නුවණින් විමසා බැලීම පාඨක ඔබ සතු කාර්යභා රයක් මෙන්ම මනුෂ්‍යයන් වශයෙන් පරම වගකීමක් ද වේ.

සමස්ත ජන සමාජයක් වෙත අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ යුතු මෙවැනි තනතුරු 1948 වසරේ ශ්‍රී ලංකාව නිදහස ලැබූ දා සිට දේශපාලන නායකත්වය විසින් තම ඡන්ද දායකයා හසුරුවා ගැනීම පිණිස විවිධ රාජ්‍ය වරප්‍රසා ද සහ වරදාන ලබා දී බහුතර භික්ෂු පද්ධතියම විනාශ මුඛයට පත් කොට ඇති බව නොරහසකි. එවැනි අවස්ථාවකදී සම්මා සම්බුදුවරයකු විසින් ලොවට පහදා ඇති විශ්ව ධර්මතාවය මත මනස සංවර්ධ නය නොකර ගත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා තම ශාසනික මෙහෙවරෙන් ක්‍රම ක්‍රමයෙන් ඈත් වී ඇත.

එකී මහා නායක හිමිවරුන් සතු ශාසනික වගකීම ඉටුවී ඇත්දැයි? නුවණින් විමසා තේරුම් ගැනීම පාඨක ඔබ සතු කාර්යභාරයකි.

සර්ව ආගමික පරිසරවර මනාව පවත්වාගෙන යා යුතු සංහිඳියාවේ කඩා වැටීම මධ්‍යයේ අතලොස්සක් වූ ප්‍රඥා සහගත ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා කිහිපදෙනෙක් තවත් අතලොස්සක් වූ මුතුන්මිත්තන් සමග තවත් අතලස්සක් වූ වර්තමාන ගිහි සමාජයේ විද්‍යා සහගත පුරවැසියන්ට පින් සිදු වන්නට සමාජයේ

හර පද්ධතිය ආශ්‍රිතව ශක්තිමත් සහසම්බන්ධතාවයන් මානෘ භූමියේ යථාර්ථයක්ව පවතී.

## 4.6 ගිහි පැවිදි දෙපාර්ශ්වයේම අභිවෘද්ධිය හා චිරස්ථිතිය

ගිහි ජීවිතයේ සහ පැවිදි ජීවිතයේ සමස්ත ඉලක්ක පැහැදිලි බෙදුම් රේඛාවකින් වෙන් ව ඇත.

"ද්වේමානි භික්ඛවෙ, සුඛානි. කතමානි ද්වෙ? ගිහීසුඛඤ්ච පබ්බජ්ජා සුඛඤ්ච, ඉමානි ඛො භික්ඛවෙ, ද්වෙසුඛානි. එතදග්ගං භික්ඛවෙ, ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං පබ්බජ්ජා සුඛං"

ජීවිතයත් මරණයත් අතර දෝලනය වන සම්මුති ලෝකයේ විශාල හෝ කුඩා ධනයකට උරුමකම් කියමින්, ඉඩකඩම්, යාන වාහන, දැකුම්කලු මන්දිර, ඇඳ පුටු මේස, ආභරණ, ශෝභන භාර්යාවන් සහ දරුවන්, උසස් තනතුරු සහ රැකියා සහිත ගිහි සැපය අවසානයේ ඇත්තේ සියලු කාම සුවයන් හැරදා උරුම වන අවිඥානක කයකි.

තිරිසන් ලෝකවල වෙසෙන අපා, දෙපා, සිවුපා, බහුපා සතුන්ද කිසිදු වස්ත්‍රයක් නොමැතිව, විවෘත පරිසරයේ යම් ප්‍රමාණයකට කාම සුවය විඳිති. ඔවුන්ට ආවේනික ගෙවල් සදා ගනිති, තම වර්ගයා බෝ කර පෝෂණය කරති. නමුත් විශ්ව ධර්මතාවයන් පිළිබඳව කිසිදු හැඟීමක් නොදැනෙන්නේ ඔවුන්ගේ සත්ත්ව නිකාය අනුව එකී සත්වයාගේ මනසේ ඉතා ඇති ඌන සංවර්ධනයයි. ඔවුන් සියලු දෙනාම ජීවත් වීම සඳහා මනුෂ්‍යයන්ට සාපේක්ෂව අප්‍රමාණ සටනක් සහ වෙහෙසක් දරන්නෝ වෙති.

ගැහැණු දරුවෙකු සහ පිරිමි දරුවකු තරුණ වියේදී කොතරම් ප්‍රේමයෙන් වෙලී සිටියත් (බහුතර) කාන්තාවන්ගේ ප්‍රාර්ථනා ඉටු කිරීම සඳහා මෙන්ම දරුවන්ගේ අභිවෘද්ධිය තකා සැමියන් බොහෝ වෙහෙසීමෙන් රැකියාව කරන්නෝය. පවුල් සංස්ථාවක් ගත් කළ ක්‍රමයෙන්ම වර්ධනය වන සීමාවක් නොමැති තණ්හා ආශා කළමනාකරණය කරගන්නට අසමත් වූවෝය. සවිඥානක කයක සිදුවන මෙම ක්‍රියාවලිය මුළුමනින්ම නියාමනය වන්නේ මනසක ස්වයංක්‍රීයව සිදුව විඤ්ඤාණය ආශ්‍රිත මායාව හේතුවෙනි. එම සංසිද්ධිය සමස්ත ලෝකයටම පොදු විශ්ව ධර්මතාවයයි.

මනසේ සිදුවන මෙම සංකීර්ණ ක්‍රියා වලිය විදර්ශනාත්මකව ප්‍රඥා සහගතව විමසා බැලිය හැකි පුද්ගලයන්ට බුදුරජාණන් වහන්සේගේ සමයේදී හඳුන්වා දී ඇත්තේ "පැවිද්දන්" ලෙසයි. කාලයක් තිස්සේ අදාල විශ්මිත දැනුම සම්ප්‍රේෂණයෙන් ප්‍රඥා සහගත "ගිහි පුද්ගලයන්" ස්වකීය දැනීමෙන් සහ ස්වකීය ප්‍රඥාවෙන් පෝෂිත වී තම තමන්ගේ අධ්‍යාත්මික සංවර්ධන ඉලක්ක ළඟා කරගත් බව ඉමහත් පැහැදිලිය.

තිරිසනුන් පවා ලබන එකී සත්ත්ව නිකාය තුළ ලබන සැපයට වඩා ඉහළ මානසික ආධ්‍යාත්මික සුවයක් පිළිබඳව බෞද්ධ දර්ශනයේ පැහැදිලි උදාහරණ සහිතව පරිශීලනය කිරීමට අවස්ථාව ඇත. එහි ප්‍රයෝජනය ලබන්නේ මනුෂ්‍යයන් අතරින් අතලොස්සකි.

## 4.7 මහා නිධාන සූත්‍රය / මහා පදාන සූත්‍රය / සබ්බාසව සූත්‍රය / මනසිකාර සූත්‍රය / මහාපරිබ්බාන සූත්‍රය

මූලිකව මෙම සූත්‍රවල අඩංගු න්‍යායාත්මක කරුණු පදනම් කොට සමස්ත වාර්තාව පිළියෙල කොට ඇත.

නූතන මානව චින්තනයේ අද්විතීය ස්ථානයක් හිමි වන්නේ "මනෝවිග්‍රහය" සහ "මනෝචිකිත්සාවටයි".

සවිඥානක කයක මුළුමනින්ම මනසේ සිදුවන මෙම සංසිද්ධිය සළායතන ක්‍රියාවලියක් ඔස්සේ සිදුවන බව ලොවට විදර්ශනාත්මකව හෙළි කිරීමට චින්තනය ඇත්තේ සම්මා සම්බුදුවරයෙකුට පමණි.

බුද්ධත්වය ලබන අළුයම යාමයකදී පහළ වන්නා වූ යයි කියන පුබ්බේ නිවාසානුස්සති ඥාණය **: පෙර ආත්මයන් ආවර්ජනය කිරීමේ නුවණ,** චුතූපපාත ඤාණය **: සත්වයාගේ චුතිය හා උත්පත්තිය දක්නා නුවණ,** ආසවක්ඛය ඥානය **: කෙලෙස් සහමුලින්ම දුරු කිරීමේ නුවණ විශ්මිතය.**

මෙකී සියලු කරුණු කාරණා ආධ්‍යාත්මික දෘෂ්ටි කෝණයකින් විමසා බැලිය යුතු අවධියක විඥානයේ ඇති සනාතන අගය අතිශයින් වැදගත් භූමිකාවක් ස්වයංක්‍රීයව රඟදැක්වේ.

සම්මුති ලෝකයේ භාවිතා කළ යුතු ආචාර ධර්ම රාශියක් ගෙනහැර දැක්වෙන, කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැකි විශ්ව ධර්මතාවය පරිශීලනය කළ හැක්කේ සූත්‍ර පිටකයේ මූලාශ්‍ර වලින් පමණකි. පැවිද්දන් විසින් කළ යුත්තේ ගිහි සමාජය වෙත මෙකී දැනුම බෙදා දී අවිද්‍යා සහගත පුද්ගලයන් ප්‍රඥාවෙන් පෝෂණය කොට විද්‍යා සහගත පුද්ගලයන් බවට පත් කිරීමයි. ඔවුන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය එයයි. සමාජ සංස්ථාවක් නිදුක් නිරෝගීව පවතින්නේ එවිටයි.

ප්‍රමාදය මුළුමනින්ම සමාජයේ පරිහානියටත්, අප්‍රමාදය දියුණුවටත් හේතු වන අන්දමත්, අප්‍රමාදයේ අනගි ශක්තිය ද, ප්‍රමාදයේ ආදීනවද ලොවට ඉස්මතු වී ජීවිතයේ හර පද්ධතියේ තාර්කිකත්වය සහ ඇල්ගොරිදමයන් ඉස්මතු වී පෘථග්ජන පුද්ගලයන් විද්‍යා සහගතව මාතෘ භූමියේ පහළ වේවා !

## 4.8 නිගමනය

### අවසන් බුද්ධ වචනය

"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා, අප්පමාදේන සම්පාදේථ"

**"මහණෙනි, මම දැන් ඔබ අමතමි. සියලු සංස්කාර නැසෙන සුලුය. නොපමාව කුසල් දහම්හි යෙදෙන්න"** (මහාපරිබ්බාන සූත්‍රය)

මෙයින් අදහස් වන්නේ අපගේ මුදල් පසුම්බියේ ඇති මුදල් වියදම් වන ආකාරයෙන්ම අප සතු සියල්ල අහිමි වී යන්නේය. ක්ෂය වී යන්නේය. විනාශ වී යන්නේය. එම නිසා ඉපදීමක් මරණයත් අතර දෝලනය වන මෙම ජීවිතයේ මනා සිහියෙන් යුත් කාලයෙහි මනා සිහියෙන් යුක්තව ජීවත් වීම යෝග්‍ය වේ.

මනා සිහියෙන් තම ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය කරන මාර්ගෝපදේශ සියල්ල පහදා දී ඇත. එසේ හෙයින් අඳුරේ අතපත ගාමින් තමන්ට අවශ්‍ය දේ සොයා ගැනීම නිෂ්ඵලය. සියල්ලෝම කුමන ආගමික පරිසරයක හැදී වැඩුණත් අපගේ පියාණන්ගේ - පියාණන්ට පෙර සිටි නෑදෑයන් හෝ මෑණියන්ගේ - මෑණියන්ට පෙර සිටි නෑදෑයන් පිළිබඳව අප දන්නෙහිද? අප දැනට ජීවත්වන නිවසේ වසර දෙසීයකට පෙර ජීවත් වී ඇත්තේ කවුරුන් දැයි අප දන්නෙහිද? කිසිවකු ජීවත් වී ඇතිද? නැතිද?

ජීවිතයේ යථාර්ථය එයයි.

"භවයෙන් භවය පුරුකෙන් පුරුක ස්වයංක්‍රීයව එකට ඈඳී ජරා මරණ සහිත වූ මේ සංසාරය කෙළවර කර ගැනීම සඳහා නිවන් සුවයක් තමන් විසින් ප්‍රඥා සහගතව අත්පත් කරගන්නාවා විනා කිසිවෙකුට ප්‍රාර්ථ නාවක් ඔස්සේ හෝ ත්‍යාගයක් ලෙස ලබාදිය නොහැක"

එසේ හෙයින් යමකුගේ අවමංගල්‍යය උත්සවයකදී "නිවන් සැප ලැබේවා" යනුවෙන් සැමට පෙනෙන සේ බැනරයක් ප්‍රදර්ශනය කිරීම කොතරම් නිශ්ඵල ක්‍රියාවක් ද? යන්න ඔබට වැටහෙනවා ඇත. භික්ෂු සමාජය මගින් ජනගත කළ යුත්තේ එවැනි බෞද්ධ සංකල්ප මිසක් කිසිසේත්ම අදාළ නොවන ප්‍රශස්ති ගී හෝ ගුණ ගායනා නොවේ.

උපතින් බෞද්ධයන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බෞද්ධයන් බවට පත්වීම සඳහා ගිහි පැවිදි දෙපාර්ශවයම අදාළ මිථ්‍යා දෘෂ්ටික පෘථග්ජන භාවයෙන් මිදී සක්කාය දිට්ඨිය ප්‍රහාණය කිරීම කෙසේ වෙතත් අවම වශයෙන් කම්මස්සකතා සම්මාදිට්ඨියට පත්වීම සඳහා උපයෝගී වේවා !

සර්ව ආගමික ශ්‍රී ලාංකිකයන් එකම පවුලක සාමාජිකයන් මෙන් ජීවත්වීමට ඉඩ සැලසේවා !

සැමට මනා සිහියෙන් ප්‍රඥා සහගතව ජීවත්වීමට හැකි වේවා !

තෙරුවන් සරණයි !

**Prof SW & Team**

## 4.9 පසුවදන

**2009 වසරේ සිට වසර දාසයකට පසුව 2025 වසරේ පවත්වන ලද "ශ්‍රී දළදා ප්‍රදර්ශනය" ආධ්‍යාත්මිකව "වන්දනාවක් නොවී" එකී මහඟු අවස්ථාව සංවිධානය කළ සියලුම පාර්ශ්වකරුවන් තාක්ෂණය සහ මානව සම්පත් සංවර්ධනයේ අද්විතීය දියුණුවක් පවතින යුගයක තම කළමනාකරණ කුසලතාවයන් මනාව විදහා දක්වමින් ජාතියේ තවත් "පූර්ණ වශයෙන් අසමත්" ව්‍යාපෘතියක් සමාජගත කොට අවසන් වූ අවස්ථාවක "මතු අනාගතයේදී මෙවැනි තත්ත්වයක් උද්ගත නොවීම" සඳහා පහත සඳහන් ප්‍රධාන මාතෘකා ඔස්සේ වැඩිදුර අධ්‍යනය සඳහා "ප්‍රඥා සහගත පුරවැසියන්ගේ" අවධානය සඳහා කෙටුම්පත් කෙරේ.**

### 4.9.1) සිවිල් පරිපාලන නිලධාරීන්

දැනට වසර 223 කට ප්‍රථම 1802 වර්ෂයේ සිට බ්‍රිතාන්‍ය ජාතිකයින් සර්ව ආගමික පරිසරවල ජීවත් වූ ශ්‍රී ලාංකිකයන් මුළුමනින්ම බ්‍රිතාන්‍ය අභිලාෂයන් පරිදි අනුගත කරවීම සඳහා විදේශීය නිලධාරීන් යොදවා ඇති අතර 1833 වසරේ සිට දැනට වසර 192 ක් තිස්සේ ක්‍රියාත්මක වන වර්තමාන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් කලින් කලට තම සේවා වපසරියෙන් බැහැර වී දේශපාලනීකරණය වී මහජන අභිලාෂයන් පිළිබඳව නොසලකා හරිමින් මූලිකව මහජනතාවට සේවා සැලසිය යුතු ආයතන නියාමනය නොකරමින් ඉටුකළ යුතු මෙහෙවර මුළුමනින්ම ගණිකා වෘත්තියේ යොදවමින් **කුරිරු ව්‍යසනයකට** ලක් කොට ඇත.

මහා නායක හිමිවරුන්ද, දේශපාලන නායකත්වයද මහජන අභිලාෂයන් සමග නියාමනය කළ යුතු දැක්ම සහ මෙහෙවර පිළිබඳව අසමත් වීම සුළුපටු ලෙස තැකිය නොහැකිය. ජනාධිපති ලේකම්වරුන් පවා බන්ධනාගාර ගත වූ යුගයක් මෑත ඉතිහාසයේ වාර්තා විය. පරිපාලන සේවයේ නිලධාරීන් අකාර්යක්ෂම වන

විට සෙසු නිලයන් තමන්ට අයිති නොවන රාජකාරී වල යෙදී සමස්ත පද්ධතියම විනාශ මුඛයට පත්වීමට ඉඩ සලසා ඇත.

**4.9.2)** ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය

සාමාන්‍ය රාජකාරී සදහා යොදවන කනිෂ්ඨ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් මහජන අභිලාෂයන් සාක්ෂාත් කිරීම වෙනුවට **නීතිවිරෝධී නියෝග** මත රාජකාරී සඳහා යොදවන ලද ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පතිවරුන්ගේ කාර්ය සාධනය පිළිබඳව මෙහි සටහන් යෙදීම නිශ්ඵලය.

ඒ මන්ද සර්ව ආගමික පරිසරවල බහුතර පුරවැසියන් සමාජ ජාලා ප්‍රබල වීම හේතුවෙන් දැනුමෙන් සහ ප්‍රඥාවෙන් පෝෂිත වී තම ජීවිතය පවත්වාගෙන යන බැවිනි. ඔවුන්ගේම උප කුලකයක් වන සමාජ ජාලා ක්‍රියාකරුවන් මගින් නියාමනය වන රජයක් ලෙස ශ්‍රී ලංකාව අර්ථ දැක්වීම කොපමණ තරමකට සාධාරණද? නැද්ද? යන්න පුරවැසියන් නොව බලධාරීන් සිතා බැලිය යුතු කරුණකි. භූමියේ යථාර්ථය එයයි .

**4.9.3)** දේශපාලන නායකත්වය

**එකම පක්ෂයකින් පාර්ලිමේන්තුවේ එකසිය පනස් නම දෙනෙකුගෙන් සමන්විත ජාතික ජනබල වේගයේ සාධනීය කරුණු පිළිබඳව අවධානය යොමු කරනු මැනවි !**

**4.9.4)** සිවිල් පුරවැසියන්

**"දළදා ප්‍රදර්ශනය" ලෙස හඳුන්වන ව්‍යාපෘතිය සහ "දළදා වන්දනාව" යන අර්ථය මනස සංවර්ධනය කරගත් විධිමත් බෞද්ධ පැවිද්දන් විසින් බෞද්ධ**

ගිහියන් වෙත පහදා දිය යුතු අවධියක, එසේ නොවන කල්හි අවිද්‍යා සහගත පෘථග්ජන පුද්ගලයන් තම මනසේ උද්ගත වන චින්තන රටා ආශ්‍රිතව "දළදා ප්‍රදර්ශනය" යන ව්‍යාපෘතියේ කොටස්කරුවන් වී "දළදා වන්දනාව" පිළිබඳව කිසිදු අදහසක් නොමැතිව තම රෝගී තත්ත්වයන්ද නොසලකා කිලෝමීටර් ගණන් දිග පෝලිම්වල දින ගණනාවක් පොලිතින් කෑලිවල රාත්‍රිය ගතකරමින්, තමන්ගේ සනීපාරක්ෂක කටයුතු හෝ දින දෙක තුනක භෞතික කය පවත්වාගෙන යාම පිළිබඳව කිසිදු සැලැසුමක් නොමැතිව මෙන්ම මහජන අභිලාෂයන් නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහාම ශ්‍රී ලංකාවේ බලාත්මක වන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් වෙත විශ්වාසය තබා මහනුවරට රැස්වීම කොතරම් අනුවේදනීය අවස්ථාවක්ද?

**4.9.5) දළදා මාලිගාවේ සියලු කාර්යභාර නිලධාරීන්**

මහානායක හිමිවරුන් යටතේ සෘජුව වන්දනීය පුද සත්කාර වලට සහ පූර්ණ භාරකාරීත්වයට යටත්ව අතිශයින් ආරක්ෂිතව රැකෙන ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ සඳහාම යෙදවී ඇති කාර්ය මණ්ඩලය අතරින් බහුතරයක් සුදු වර්ණයෙන්ම සැරසී කඹ වැනි පිරිත් නූල් අතැතිව සිදු කරන ක්‍රියාන්විතය නිරීක්ෂණය කළ විට  කළ විට මෙම "දළදා ප්‍රදර්ශනය" සංවිධානය කිරීමේ ව්‍යාපෘතියේ අසමත් කොටස්කරුවන් නොවන්නේද**?**

"දළදා වන්දනාවක්" ලෙස තම මනසේ පවත්වාගෙන යා යුතු ඉහළ ආධ්‍යාත්මික සංවර්ධන ඉලක්ක වෙත ක්‍රියාකළ යුතු බහුතර පුරවැසියන් අවිද්‍යා සහගත බව දුරලීම සඳහා සූත්‍ර පිටකයේ සඳහන් තාර්කිකත්වය සහ ඉහළ ඇල්ගොරිදමයන් පිළිබඳව ඔවුන් අවබෝධයෙන් ක්‍රියා කරන බව ඔබ විශ්වාස කරන්නේද**?**

### 4.9.6) මහානායක හිමිවරුන්

සූත්‍ර පිටකයේ සඳහන් විශ්මිත ධර්මතාවයන්ට අනුව දැනට මහනායක හිමිවරුන් ලෙස හඳුන්වන සවිඥානක කයවල් මහානායක හිමිවරුන් ලෙස විද්‍යා සහගත මෙන්ම ප්‍රඥා සහගත ලෙස ගිහි පාර්ශවයන් විසින් හඳුන්වන්නේ ද?

නැවතත් සර්ව ආගමික පරිසරයක බෞද්ධ නායකයන් ගැන පමණක් සාකච්ඡා කෙරෙන මෙම වාර්තාවට අනුව මහා නායක පදවි දරන හිමිවරුන් යනුවෙන් හඳුන්වන්නේ කවුද? සූත්‍ර පිටකයේ සඳහන් ධර්මතාවයන් හොඳින් අවබෝධ කොට ගෙන ලෝකවා සී සත්වයා සංසාර දුකින් මුදවාලීමට අවශ්‍ය මාර්ගය පහදා දිය යුතු ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමකි. ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය විනය පිටකයේ මැනවින් සඳහන් වේ. රාජ්‍ය පාලකයා සහ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ යනු දෙකොටසකි. අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරනු වෙනුවට වරදාන වරප්‍රසාද හමුවේ සමස්ත හර පද්ධතියම විනාශ වන අවස්ථාවන්හිදී මුනිවත රකින්නේ මෙම ජ්‍යෙෂ්ඨ භික්ෂූන් බෞද්ධ දර්ශනයේ කියවෙන මූලික න්‍යායයන් කිසිවක් සමාජයට දායාද නොකරන බැවිනි.

### 4.9.7) සර්ව ආගමික පරිසරයක සෙසු ආගමික නායකයන් සහ ජන සමාජය

බහුතර බෞද්ධයන් සූත්‍ර පිටකයේ ඉගැන්වීම් සහ මූලාශ්‍ර මත පිහිටා සිට නුවණින් කල්පනා කොට ප්‍රඥාව සමතු කර ගනිමින් ගරු කළ යුත්තේ මෙම පිරිසටයි.

යම් අයකු විසින් අදහස් වල විෂමතාවයක් හෝ ගැටළු කාරී තත්වයක් පෙන්වන්නේ නම් සංහිඳියාවේ මූලධර්ම මත ඔවුන් යහමගට ගැනීමට උත්සාහ කළ යුතුයි. තමන් විසින් නීතිය අතට ගෙන ක්‍රියා කිරීමට නොගොස් ඒ සඳහා

මහජන අභිලාෂයන්ට වගකිවයුතු වග කිව යුතු බුද්ධශාසන ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත පැමිණිලි කොට, ඔහු මහජන අභිලාෂයන් පරිදි ක්‍රියා කරන්නේද? යන්න පසු විපරම් කොට, ක්‍රියා නොකරන්නේ නම් නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කරවා ගත යුතුයි. එම කර්තව්‍යය ද ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයව සිදුවන්නේ නැත. ඒ සඳහා ගිහි පැවිදි දෙපක්ෂයටම බෙදුම් රේඛාවක් අවශ්‍ය නොවේ. ඒ මන්ද දූෂිතයෙකුට හෝ වංචනිකයෙකුට හෝ නීතිය කඩ කරන කිසිවකුට හෝ මහජන අභිලා ෂයන්ට විරුද්ධ වන කෙනෙකුට දඬුවම් ලැබිය යුතු බව අදාළ අංශවලට වාර්තා කළ යුතුව ඇත්තේ සහ පසු විපරම් කළ යුතුව ඇත්තේ පුරවැසියන් විසිනි. දඬුවම් දීම හෝ දඬුවමේ ස්වභාවය තීරණය කළ යුත්තේ අධිකරණ පද්ධතිය මගින් බව මනාව සිහියේ තබාගත යුතුය. අධිකරණ පද්ධතියක ශක්තිමත්භාවය ස්ථාපිත කරගත යුත්තේ ද පුරවැසියන් විසින් බව තේරුම් ගත යුතුය.

සවිඥානික කයක් විළි වසාගෙන සිටින්නේ කසාවතකින්ද? නිල ඇඳුමකින්ද? ජාතික ඇඳුමකින්ද? වේට්ටියකින් ද? සරමක් බැනියමකින්ද? යන වග කොහෙත්ම අදාළ නොවේ.

සියලුම නාලිකා දේශපාලනීකරණය වීමෙන් අනතුරුව "මහජන අභිලාෂයන්" සමාජ ජාලාවල කාලීන මෙන්ම ප්‍රශස්ත මට්ටමේ දැනුවත් කිරීම් තුළින් පුරවැසියන් දැනුමෙන් පෝෂණය වී ප්‍රඥාවෙන් අගතැන් වී ඇති යුගයක මධ්‍ය ලක්ෂයෙන් පිටත සිටින පැවිද්දන් හෝ ආගමික නායකයන් හෝ දේශපාලනඥයන් හෝ දූෂිත අධිකරණ විනිසුරන් හෝ රාජ්‍ය නිලධා රීන් හෝ කවරෙක් හෝ ඉතා කුඩා වස්තූන්ය.

**SaliyaT** පෙර ගමන් ආරම්භ කරන ලද්දේ පසු ගමන් යාමට නොවේ. අන්තර්ජාලයේ ප්‍රසාරණය වී ඇති අපගේ බුද්ධිමය දේපළවල ස්ථාවරත්වය පරිශීලනය කොට බලන්න. අප සිදු කරන්නේ දේශපාලනය නොවේ.

දේශපාලනඥයන් සහ නිලධාරීන් පාලනය කිරීමයි. නියාමනය කිරීමයි. ඔවුන් ගේ අවිධිමත් වැඩපිළිවෙළවල් සමාජගත කිරීමයි.

අපට අණ දීමට හැක්කේ පුරවැසි ඔබටයි. ඒ සඳහා යෝජනා, චෝදනා, පැමිණිලි, දුක්ගැනවිලි ඔබේ ජංගම දුරකථනයෙන් වාර්තා කළ හැකි එකම විධිමත් පුළුල් විද්‍යාත්මක විසඳුම් පවතින්නේ අප සතුවයි.

කිසිදු කරුණකට බිය නොවන්න. **Virtual Parliament** බලය තිබෙන්නේ අප සතුවයි.

**159** දෙනා අපගේ විද්‍යාත්මක විසඳුම් හමුවේ වසරක පහකට පත් වී ඇති සුළු සේවකයන් පමණි. වැඩ බැරිකම නිසා සමහර විට ඊටත් කලින් ස්වයංක්‍රීයව සමාජයෙන් කුණු බක්කියට විසි වන්නට බොහෝ දුරට ඉඩකඩ තිබේ.

ඡන්ද වලට කලින් වේදිකාවල වාචාල කමට චතුර ලෙස කතා කළ අය මේ වන විට අහු මුළු වල සැඟවී ඇත්තේ ඇයි?

බොහෝ ආණ්ඩු තම ධූර කාලයට කලින් කඩා වැටී තිබේ.

රජයේ අධිකරණය නොව **“ජනතා අධිකරණය” Public Opinion** වන්නේ ඔබයි.

ප්‍රඥා සහගතව ගනිත්වා !

Prof SW & Team for SaliyaT

27 04 2025